# <u>පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය</u>

AAT/40/2021 (PSC)

ඩබ්.එස්.පී.සිල්වා,

**අභියාචක**

**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය :-2026.06.02**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක ඒ.එම්.වන්සේකර මහතා,
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් ජේ.එම්.දිසානායක මිය.

## -<u>නියෝගය</u>-

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

මෙම කරුණට අදාළ අභියාචක වන ඩබ්.එස්.පී.සිල්වා යන අය විසින්, 2020.11.02 දාතමින් යුක්තව අභියාචනා පෙත්සමක් ඉදිරිපත් කර ඇත. එකී පෙත්සමේ දිනය ලෙස, 2020.11.02 යන දිනය යොදා ඇතත්, එකී පෙත්සම මෙම විනිශ්චය අධිකාරය වෙත ගොනු කර ඇත්තේ, 2020.11.23 වෙනි දිනදීය. ඒ අනුව අභියාචනය ඉදිරිපත් කළ යුතු සති 04ක කාලපරිච්ඡේදය, ඒ වන විට ඉකුත් වී ගොස් තිබූ නිසා, ඒ සම්බන්ධව තීරණයක් ලබා ගැනීමට විනිශ්චය අධිකාරයේ එවකට සභාපතිතුමා වෙත ගොනුව ඉදිරිපත් කර ඇත. ඒ අනුව සභාපතිතුමා විසින් 2021.03.02 දින නියෝගයක් කරමින්, පාර්ශවකරුවන්ට දැන්වීම් නිකුත් කරන ලෙසට දැනුම් දී ඇත. කෙසේ වෙතත්, මෙම අභියාචනය ප්‍රථම වරට විනිශ්චය අධිකාරය ඉදිරියේ 2022.06.08 දින කැඳවා ඇත.

මෙහිදී සඳහන් කළ යුතු කරුණක් වන්නේ, අභියාචක කිසිදු අවස්ථාවක මෙම විනිශ්චය අධිකාරය ඉදිරියේ පෙනී සිට නැති බවයි. මෙම

තත්ත්වය යටතේ මෙම කරුණ 2025.02.11 වෙනි දින කැඳවන ලද අවස්ථාවේ දි, අභියාචක විනිශ්චය අධිකාරය ඉදිරියේ පෙනී නොසිටීම සළකා බලා, ඔහු වෙනුවෙන් වෙනත් අයෙකු පෙනී සිටින්නේ නම් එය තහවුරු කිරීමට පිළිගත හැකි ලේඛනයක් ඉදිරිපත් කරන ලෙසට, එදින අභියාචක වෙනුවෙන් පෙනී සිටි එම්.කරපුටුගල මහතාට දැනුම් දෙන ලදි. ඒ අනුව 2025.07.26 දිනැති එම්.කරපුටුගල මහතා විසින් අත්සන් තබා ඇති ලිපියක් සමඟ විදේශයක සාදන ලදැයි කියනු ලබන විශේෂ ඇටෝර්නි බලපත්‍රයක් යැයි කියනු ලබන ලේඛනයක් ඉදිරිපත් කර ඇත. එම ලේඛනය පිළියෙල කර ඇත්තේ එච්.එම්.ජයකොඩි නැමැති මහනුවර පදිංචි පුද්ගලයෙකු විසිනි. එම ලේඛනය නවසීලන්තයේ වෙලින්ටන් නුවර පිහිටා ඇති ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ නිලධාරියෙකු වන ඒ.එම්.බී.අම්බලන්ගොඩ යන අයෙකුගේ මුද්‍රාව සහිතව, ඔහුගේ යැයි කියන ලබන අත්සනක් ද සහිතව එවා ඇත. එහි වලංගු භාවය ප්‍රශ්න කිරීමට පරිපාලන විනිශ්චය අධිකාරය කැමැත්තක් දැක්වූයේ නැත.

ඒ අනුව එම ලේඛනය පිළිගනිමින් අභියාචක වෙනුවෙන් එම්.කරපුටුගල මහතාට මෙම විනිශ්චය අධිකාරය ඉදිරියේ පෙනී සිටීමට අවස්ථාව ලබා දී ඇත. ඉන් අනතුරුව මෙම අභියාචනය 2025.10.02 වෙනි දින කැඳවා ඇති අතර, එදින මෙම අභියාචනයට අදාළ කරුණ සම්බන්ධයෙන් වන විමසීම 2026.03.27 දිනට දින නියම කර ඇත. එදින දෙපාර්ශවයම ඉදිරිපත් කරන ලද කරුණු වලට සවන්දීමෙන් පසුව, ඒ සම්බන්ධයෙන් ලිඛිත දේශන ගොනු කරන ලෙසට වැඩිදුරටත් දැනුම් දී ඇත. ඒ අනුව මෙම අභියාචනය සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති සියළුම කරුණු සළකා බලන ලදි.

2020.11.02 දින ඉදිරිපත් කර ඇති මෙම අභියාචනය මඟින් අභියාචක ඉල්ලා ඇත්තේ, ඔහුට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන 30/88 යටතේ විශ්‍රාම ගැනීමට අවස්ථාව සළසා දෙන ලෙසටය. එම ඉල්ලීම අභියාචක විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීමෙන් අනතුරුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එවා ඇති 2017.07.30 දිනැති ලිපියේ සඳහන් පරිදි, අභියාචකගේ එම ඉල්ලීම නිෂ්ප්‍රභ කර ඇත.

මෙම කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති 2026.03.03 දිනැති වාර්තාවෙහි සඳහන් වන්නේ, අභියාචක විසින් ඉහත කී විශ්‍රාම ගැන්වීම

සඳහා වන ඉල්ලීම කර ඇත්තේ, 2011.12.02 දින දි බවයි. එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත්තේ, ඉහත කී 30/88(1) දරණ චක්‍රලේඛයේ 09 වන වගන්තිය යටතේ වන විධිවිධාන සළකා බැලීමෙන් අනතුරුවය. එම වගන්තියට අනුව, කිසියම් නිලධාරියෙකු සේවා බැඳුම්කරයකට ඇතුළත් වී ඇති විටෙක ඔහු විශ්‍රාම යෑමට ප්‍රථමයෙන්, අනිවාර්යෙන්ම සේවය කළ යුතු කාලය සම්පූර්ණ කළ යුතුවේ. එම කොන්දේසිය මත කටයුතු කරමින් අභියාචකගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. එම නියමයන් සම්පූර්ණ නොකිරීම හේතුවෙන්, අභියාචක සේවය හැර ගියා සේ සළකමින්, 2013.11.26 දිනැති නිවේදනය, අභියාචක වෙත නිකුත් කර ඇත. ඉහත කී ලිපියට අනුව අභියාචක විසින් ගෙවිය යුතු මුදල් ගෙවූ බව සනාථ කිරීම සඳහා කිසිදු ලේඛනයක් ඔහු විසින් ඉදිරිපත් කර නැත. ඒ අනුව, ඉහත කී කරුණුත්, 30/88(1) වගන්තියේ විධිවිධාන සළකා බලා, අභියාචක විසින් විශ්‍රාම යෑමට කර ඇති ඉල්ලීමට ඉඩ ලබාදිය නොහැකි බවට දන්වා ඇත.

තවද, මෙහිදී සඳහන් කළ යුතු කරුණක් වන්නේ, අභියාචක වෙත දැනටමත් සේවය අතහැර යාමේ නියෝගයක් නිකුත් කර ඇති බැවින්, එම නියෝගය ඉවත් කර නොගෙන, ඔහු වෙත විශ්‍රාම ලබා ගැනීමේ අයිතිවාසිකම් තිබේද යන කරුණ, සළකා බැලීමක් කළ නොහැකි බවයි. අභියාචක වෙනුවෙන් 2026.03.12 වෙනි දින ඉදිරිපත් කර ඇති ලේඛනයේ 15 වන ජේදයේ සඳහන් වන්නේ, ඔහුගේ උපන් දිනය 1964.01.27 වෙනි දිනය වන හෙයින්, ඔහුට ඉදිරියට සේවය කිරීමට සේවා කාලයක් නොමැති බවයි. මෙවැනි තත්ත්වයක් යටතේ අභියාචක නැවත සේවයේ පිහිටුවීමට ද ඔහුගේ වයස බාධාවක් වනවා ඇත.

තවද, ඔහු 2007.01.31 වෙනි දින සිට වසර පහක කාලයක් විදේශගතව සිටීමෙන් අනතුරුව, 2011.11.01 වෙනි දින නැවත සේවයට වාර්තා කරන ලද බව ඉහතකී ලේඛනයේ වැඩිදුරටත් සඳහන් වේ. ඉන් පසුව මාසයක පමණ කාලයක් පමණක් ගතවීමෙන් අනතුරුව, ඔහු නැවත වරක් 2011.12.05 වෙනි දින විදේශගතවී ඇත. ඉන් අනතුරුව ඔහු සේවයට වාර්තා කර ඇති බවට සාක්ෂියක් ඉදිරිපත් නොවේ. ඇත්ත වශයෙන්ම අභියාචක 2007.11.01 දින සිට (මාසයක කාලයක් හැර) රජයේ සේවයේ නියුතුව නැත. එම කරුණ මතම ඔහු නැවත සේවයේ පිහිටුවීමට

නියෝගයක් කළ නොහැක. එයින්ම පෙනී යන්නේ, අභියාචක ඔහු සිටි තනතුරේ සේවය කිරීමට කිසිදු අභිලාෂයකින් හෝ කැමැත්තකින් යුක්තව කටයුතු කරන පුද්ගලයෙකු නොවන බවයි.

ඉහත කරුණු සළකා බලා, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-